# ECHO OF HIS CALL

## කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVII | DECEMBER 2022 | Issue No. 01


### ශුද්ධවූ බයිබලය

(ලූක් 1:26-33)

26. සවෙනි මාසයේදී, ගලීලයේ නාසරෙත් නම් නුවරක විසූ, දාවිත්ගේ වංශයෙහි වූ යෝසෙප් නම් මනුෂ්‍යයෙකුට විවාහබස් දී සිටි,

27. කන්‍යාවකු වෙතට දෙවියන්වහන්සේ වෙතින් ගාබ්‍රියෙල් නම් දූතයා යවනලද්දේය. ඒ කන්‍යාවගේ නාමය මරියාය.

28. ඔහු ඈ සිටි තැනට පැමිණ බොහෝ කරුණාව ලැබූ තැනැත්තිය ශුභසිද්ධ වේවා, ස්වාමීන්වහන්සේ නුඹ සමඟ සිටිනසේකැයි කීවේය.

29. නුමුත් ඈ ඔහුගේ කීමට බොහෝ සේ කැලඹී, මේ කෙබඳුවූ ආචාරයක්ද කියා කල්පනාකරමින් සිටියාය.

30. දේව දූතයා ඈට කථා කොට, මරියා, භිය නොවන්න. මක්නිසාද නුඹට දෙවියන්වහන්සේගේ කරුණාව ලැබුණේය.

31. බලව, නුඹ ගර්භණීව පුත්‍රයෙකු බිහිකරන්නීය, උන්වහන්සේට යේසුස් යන නාමය තබන්න.

32. උන්වහන්සේ උතුම්ව මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝයයි කියනු ලබනසේක. උන්වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙව්වූ ස්වාමීන්වහන්සේ උන්වහන්සේට දෙනසේක.

33. උන්වහන්සේ යාකෝබ්ගේ වංශය කෙරෙහි සදාකාලේටම රජකම්කරනසේක, උන්වහන්සේගේ රාජ්‍යය කෙළවර නොවන්නේයයි කීයේය.



# නත්තල් ආශිර්වාදය

## BLESSINGS OF CHRISTMAS!

*Pr. K. R. Rajasekaran*

ලෝකයේ බොහෝ දෙනෙකුට පළමු නත්තල අහිමි විය. මන්ද එදා සිදුවූයේ කුමක්ද කියා ඔවුන් නොදැන සිටී. එහි තිබූ වැදගත්භාවයද ඔවුන් දැන සිටියේ නැත. එදා පළමු නත්තලෙහි සිටිනු ලැබුයේ බොහොම සුළු පිරිසක් පමණි. නමුත් වසර 2000 කට පසුව නත්තල් කියන්නේ කුමක්ද කියා අද මුළු ලෝකයාම දනී. අද කෝටි ගණන් සෙනඟ නමස්කාර දේව මෙහෙයන් වලට සහභාගී ක්‍රිස්තුස්වහන්සේගේ උපත සමරති. එදා නත්තල ගැන දැන සිටියේ මරියා, යෝසෙප්, එඬේරුන් සහ දිවැසිවරු යන ඉතාම සුළු පිරිසකි. මේ අය පළමු නත්තලේදී සිටියේ ඇයි? දෙවියන්වහන්සේ තෝරාගන්නේ කාවද? සේවය සඳහා පාවිච්චි කරන්නේ කාවද? කියා ඔබ මොහොතක් සිතන්න.

මරියා, යෝසෙප්, එඬේරුන් හා දිවැසිවරු යන අය කල ක්‍රියාවම ඔබත් කලහොත් දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරනවා ඇත. මෙම නත්තල ඔබටත් ආශිර්වාද නත්තලක් වේවා. ඔබ මේ අය දෙස බලන විටදී යෝසෙප් සහයෝගය දෙමින් ක්‍රියා කරනු ලැබීය. එඬේරු සමරනු ලැබීය. මරියා මෙනෙහි කරන ලැබූ අතර දිවැසිවරුන් කැපවීමක් කරනු ලැබීය. අප මේ එක් එක් කාරණාවන් ගැන විස්තරාත්මකව සොයා බලමු.

### (1). යෝසෙප් දෙවියන්වහන්සේගේ සැලැස්මට එකඟව ක්‍රියා කලේය.

*''යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තිය මෙසේ විය. උන්වහන්සේගේ මවුවූ මරියා යෝසෙප්ට විවාහබස් දී සිටියදී, ඔවුන් එක්වෙන්ට පළමුවෙන්, ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ඈ ගර්භණීවූ බව දැනගන්නා ලදී. ධර්මිශ්ඨයෙක්ව සිටී ඇගේ පුරුෂයා වූ යෝසෙප් අද නින්දාවට පමුණුවන්ට නොහැකිව, රහසින් අද අත්හරින්ට සිතුවේය. නමුත් ඔහු මේ කාරණා කල්පනාකරමින් සිටියදී, බලව, ස්වාමීන්වහන්සේගේ දූතයෙක් ස්වප්නයකින් ඔහුට පෙනී, 'දාවිත්ගේ පුත්‍රවූ යෝසෙප්, නුඹේ භාර්යාවවූ මරියා පාවාගන්ට භය නොවන්න. මක්නිසාද ඈ තුළ පිළිසිඳුණාවූ යමක් ඇද්ද එය*

3 වෙනි පිටුවට ...

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

(ECHO GROUP)

## *from your dearly beloved brother...*





# කැඳවීමේ ප්‍රතිරාවය

"... The Egyptians whom ye have seen to day, ye shall see them again no more for ever"
- Exodus 14:13

## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran
Dr. A. Richard Samuel, M.A., Ph.D.
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858
CORE LEADERS
Bro. K. Puratchivendan
Bro. A. Edward Durai
Bro. A. Alvin
Bro. K. Abraham
Sis. Dhanalakshmi Chinnaiah
E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

**ප්‍රේමණීය මිත්‍රයෙනි,**

**අපගේ ස්වාමිවූ විශ්වයේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත් නාමයෙන් ඔබට සුභ පැතුම් ගෙනෙමි.**



*Our Residential Hindi Students*

ප්‍රේමණීය සහෝදරයා සහෝදරිය,

අපගේ දෙවි පියාණන්ගේ සමාදානය සහ කරුණාව ඔබට ලැබේවා. 2022 වසරේ අපට ආශිර්වාද කලාවූ දෙවියන්වහන්සේ 2023 වසරේදීත් ඔබ හා සමඟ සිටිමින් ඔබට ආශිර්වාද කරන සේක.

ඔබට දෙවියන්වහන්සේගේ කරුණාව තුළින් හොඳ සුවයෙන් සිටිනු ඇතැයි අප විශ්වාස කරමු. අපගේ යාච්ඤා හා කන්නලව් වලදී ඔබ නිසා අප දෙවියන්වහන්සේට ස්තුති කරමු. සැබැවින්ම දෙවියන්වහන්සේ එන්න තිබෙන්නාවූ දින වලදී මහත් වූ දේ කරනු ඇත. ඔබගේ ජීවිතයේ හාස්කමකට දෙවියන්වහන්සේව විශ්වාස කරන්න.

ඉන්දියා දේශය හා අප අවට දේශ වලට ස්වාමීන්වහන්සේ නොදන්නාවූ සෙනඟට ශුභාරංචිය දීමට අප ඉතා ඕනෑකමින් ක්‍රියා කරමු. තවද නෙහෙමියා බයිබල් විද්‍යුහලෙහි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ව අපි විශාල අස්වැන්නක් සඳහා සූදානම් කරමු. ඔවුන් ඉතා උනන්දුවෙන් ඉගෙනීමේ කටයුතු කරගෙන යති. මෙම බයිබල් විද්‍යුහලට උදවු උපකාර කරමින් ඒ උදෙසා යාච්ඤා කරන්නාවූ සියලුදෙනාටම අපි ස්තුතිවන්ත වෙමු. දිගටම ඔබ මේ ක්‍රියාව කරන්න.

අප හා සමඟ සේවය කරන්නාවූ අප හට අප ශුභාරංචි පත්‍රිකා සහ පොත්පත් නොමිලයේ බෙදා හැරීමට ක්‍රියා කලේය. අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ මුද්‍රණාලයෙහි සේවය කරන අය නිසා හා ඔවුන්ගේ වෙහෙස මහන්සිය ගැන අප ස්තුති කරමු.

තරුණ තරුණියන් උදෙසා අප විශේෂ සම්මේලයක් පැවැත්වුවෙමු. අපගේ සහෝදර සහෝදරී ඇන්ජලින් සෙල්ව කුමාරි, පූජක සනී ප්‍රසාද්, පූජක ආනන්ද බාබු වැනි අයව දෙවියන්වහන්සේ මේ සඳහා ඉතා බලවත් ලෙස පාවිච්චි කලේය.



*Pr. Jacob Jeya Kumar, our Gospel Tract Distributor at Villuppuram town.*



*Bro. Solomon Manoharan, businessman, 99 K.M. Coffee Magic & Village Pastor, Mullaivanan, our BIBLECOR Bible Correspondence Course Graduate, Cheyyoor.*



*Pr. Jeba Daniel, Valliyoor town.*



*Pr. Stephen Karthik, Virudhunagar town.*

**Our Ministries:** ☼ ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ☼ BIBLECOR - Postal Courses (3 languages) ☼ Online Courses ☼ Theological Correspondence Courses (2 languages) ☼ Church Planting ☼ Nehemiah Bible Colleges ☼ Gospel Printing Press ☼ Great Commission Partners ☼ St. Paul's Matriculation School ☼ Crusades ☼ Community Development

ප්‍රිය මිත්‍රවරුනි, දෙවියන්වහන්සේගේ සේවය තුළ මෙහෙ කිරීම ඉතා පහසු දෙයක් නොවේ. අපට නපුරු බලවේග සමඟ ක්‍රියා කිරීමට සිදුවී තිබේ. පවුලේ අසනීප තත්වයන්, අපගේ සේවකයින්ගේ අසනීප තත්වයන්, දේශපාලන බලපෑම්, ක්‍රිස්තියානියට විරුද්ධව ඇති බලපෑම්, ආර්කථි ප්‍රශ්න වැනි බොහෝඅන්ධකාර බලවේග වලට විරුද්ධසටන් තිබේ. මෙවැනි දේවලට විරුද්ධව අපත් සටන් කරමු. අද දෙවියන්වහන්සේගේ දාසයින් බොහෝ දෙනෙක් මෙවැනි අමාරුකම් තුළින් ගමන්කරනු ලබයි. ඔබගේ යාච්ඤාව හා උපකාරයන් නොමැතිනම් මෙවැනි පීඩා තුළින් ජය ගැනීමට අපට ඉතා අසීරුය.



Sis. Angeline Selvakumari



Rev. Dr. Sunny Prasad



Rev. Dr. Anand Babu

එම නිසා,

(i). අප ගැනද, දේව දාසයින් ගැනද, ඉන්දියා දේශය හා අසල්වැසි රටවල තිබෙන සභාවන් ගැනද යාච්ඤා කරන කාලය තවත් වැඩි කරන්න.

(ii). කැඳවීමේ ප්‍රතිරාවය සේවයෙහි යෙදී සිටින්නාවූ පාලකවරු, ශුභාරංචිය ගෙනයන්නන්, ගුරුවරුන් සහ ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලේ ගුරුවරු හා නෙහෙමියා බයිබල් විදුහලේ සේවක මඩුල්ලටද ඔබගේ සේවය අවශ්‍යව ඇත.

(iii). ඔබ අපට දෙන්නාවූ දීමනාවන් හා උපකාරයන් ස්වාමීන්වහන්සේගේ මඟපෙන්වීම අනුව වැඩියෙන් ලබාදෙන්න. මන්ද මුද්‍රණාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය වල මිල ඉතා ඉහල ගොස් ඇති නිසාත් තැපැල් ගාස්තු වැඩිවී ඇති නිසාත් නඩත්තු කටයුතු හා තවත් බොහෝ අවශ්‍යතා සඳහාද අපට උපකාර කරන්න.

කොවිඩ් 19 ට පසු සභාවට පැමිණියාවූ අයගේ සංඛ්‍යාවෙහි යම් අඩුවීමක් ඇති වී තිබේ. එම නිසා සෑම සිකුරාදාවකම සවස 6.00 - 7.30 දක්වා එක් එක් පලාත් මට්ටමින් සහභාගිවීමට නොහැකි වූ අය සඳහා යාච්ඤාවක් ආරම්භ කර තිබේ. ඒ අවට සිටින පවුල්ද මේ සඳහා එකතු කරගන්නෙමු. මෙම යාච්ඤාවන් වලට සහභාගීවන අයගේ සංඛ්‍යාවද ඉතා සීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී. මෙහි සියලු ගෞරවය හා මහිමය ස්වාමීන්වහන්සේට හිමි වේවා. ජාති



කුල ආගම් භේදයකින් තොරව කොවිඩ් 19 ව්‍යසනයට පත්වූ සියලුම දෙනාට උපකාර කිරීමට අපට හැකියාවක් තිබේ. තවත් මෙම දිළිඳු අයට උපකාර කිරීමට බෙහෙත් ද්‍රව්‍ය සහ අධ්‍යාපන අවශ්‍යතා අපට අවශ්‍යව තිබේ. මෙම අවශ්‍යතා සපයා ගැනීමට දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ හදවත් වලට කථාකර උපකාර කරන්නය කියා අප යාච්ඤා කරමු. මේ අවශ්‍යතා උදෙසා ඔබ උපකාර කිරීමට කැමති නම්, දෙවියන්වහන්සේ ඔබට කථා කරනවා නම්, කැඳවීමේ ප්‍රතිරාවය සේවයට ඔබගේ ආධාර යේමු කරන්න. කැඳවීමේ ප්‍රතිරාවය සේවය රජයේ පුන්‍ය ආයතනයක් වෙයි.

ඔබ හා ඔබගේ අවශ්‍යතා උදෙසා අපි යාච්ඤා කරමු. දෙවියන්වහන්සේ ඔබට වඩ වඩා ආශිර්වාද කරන සේක. තවද ලබන්නාවා 2023 වන නව වර්ෂයට අලුත් බලයක් ශක්තියක් හා ප්‍රඥාවක් ඔබට ලැබෙන්නය කියා අපි ප්‍රාර්ථනා කරමු.

''ස්වාමීන්වහන්සේ නුඹට ආශිර්වාද කොට නුඹ ආරක්ෂාකරනසේක්වා. ස්වාමීන්වහන්සේ ස්වකීය මුහුණ නුඹ කෙරෙහි බබළවා නුඹට කරුණාකරන සේක්වා. ස්වාමීන්වහන්සේ ස්වකීය මුහුණ නුඹ කෙරෙහි ඔසවා නුඹට සමාදානය දෙන සේක්වා.'' (ගණන් කථාව 6:24-26)

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සෑම්සන් සෑම්**

(+91) 98412 71858 / 98410 71858,
E.mail : samselvaraj333@gmail.com

*1 පිටුවෙන්....*

*ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙනය. ඈ පුත්‍රයෙකු වදන්නීය, උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න, මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපවලින් ගලවන්නේ උන්වහන්සේයයි කීවේය. මේ සියල්ල සිදුවූයේ බලව කන්‍යාව ගර්භණීව පුත්‍රයෙකු වදන්නීය.*

*උන්වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනවා ඇත, කියා ස්වාමීන්වහන්සේ අනාගතවක්තෘ ලවා කියෙවු කීම සම්පූර්ණවන පිණිසය. ඒ නාමයේ අර්ථය නම් දෙවියන්වහන්සේ අප සමඟ යනුයි. එවිට යෝසෙප් නින්දෙන් පිබිද, ස්වාමීන්වහන්සේගේ දූතයා ඔහුට අණකල ලෙස කරනුයේ තමාගේ භාර්යාව පාවාගත්තේය.'' (මතෙව් 1:18-24)*

නත්තල් කථාන්දරය දෙස බලන විටදී යෝසෙප්ව කිසිවෙක් විශේෂ ලෙස සැලකූ තැනැත්තෙක් නොවේය. ඔහුගේ

චරිතය මිනිසුන් නොසලකා හැර තිබේ. අප යෝසෙප් ගැන වැඩි විස්තර නොදනී. ඔහු සාමාන්‍ය මනුෂ්‍යයෙකි. ඔහු දුප්පත් තරුණයෙකි. ඔහුට හරි හමන් රස්සාවක් හා මුදල්ද තිබුණේ නැත. ඔහු මරියා සමඟ විවාහවීමට නියමකර තිබුණි. නමුත් මරියා ශුද්ධාත්මයාණන් කරණකොට ගෙන දරුවෙකු පිළිසිඳගෙන තිබුණි.

මිත්‍රවරුනි, මෙය ඔබගේ ජීවිතයෙහි සිදු වුවා නම් ඔබට සිදුවන්නේ කුමක්ද? මෙය ඉතාම අසීරු දෙයකි. එනම්, තමා විවාහවීමට සිටින්නාවූ තැනැත්තී ගර්භණීයව සිටීම, මෙය යෝසෙප්ගේ ජීවිතයේ සිදුවූ සෝදිසියකි. යෝසෙප් ධර්මිශ්ඨ පුද්ගලයෙකු නිසා ඔහු මරියාව ලැජ්ජාවට පත් කිරීමට අකමැතිව ක්‍රියා කල බව දේව වචනයෙහි සඳහන්ව ඇත. එම නිසා ඔහු මරියාව රහසිගතව අත්හැරීමට තීරණය කලේය. ***''ධර්මිශ්ඨයෙක්ව සිටි ඇගේ පුරුෂයා වූ යෝසෙප් ඇ නින්දාවට පමුණුවන්ට නොකැමතිව, රහසින් ඇ අත්හරින්ට සිතුවේය.'' (මතෙව් 1:19)*** ඒ කාලයේදී විවාහ ගිවිසගැනීම විවාහවීමට සමානය. එය එකිනෙකා සමඟ බැඳීමක් ඇති කරන්නාවූ ගිවිසුමකි. මෙය කැඩීමට බැරිය. මෙය කැඩීමට නොහැකිය. මෙය කැඩීමට අවශ්‍ය නම් ඔබ දික්කසාද විය යුතුය. එම නිසා යෝසෙප් මරියාව රහසිගතව දික්කසාද කිරීමට සූදානම් විය. මේ අවස්ථාවේදී දේව දූතයෙක් යෝසෙප්ට ස්වප්නයකින් පෙනී කථා කරනු ලැබීය. යෝසෙප් නින්දෙන් අවදිවූ විට දේව දූතයා තුළින් දෙවියන්වහන්සේ ඔහුට පැවසූ අණට ඔහු කීකරු විය. ඔහු මරියාව ඔහුගේ භාර්‍යාව හැටියට භාර ගත්තේය. ***''එවිට යෝසෙප් නින්දෙන් පිබිද ස්වාමීන්වහන්සේගේ දූතයා ඔහුට අණකල ලෙස කරනුයේ,'' (මතෙව් 1:24)*** ඔහුට කිරීමට බැරි දෙයක් කරන පිණිස විශාල ඇදහිල්ලක් ඔහුට අවශ්‍ය විය. ඔහුගේ ජීවිතයේ සැලැස්මට දෙවියන්වහන්සේගේ සැලැස්ම ක්‍රියාත්මක වීමට ඔහු ඉඩ දුන්නේය.

ඔබට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය අවශ්‍ය නම්, ඔබගේ ව්‍යාපාර කටයුතු වලට, විවාහයට, ඔබගේ මිත්‍රයින් සමඟ ඇති සම්බන්ධතා වලට, ඔබගේ මූල්‍යමය පැති වලට ආදී සියල්ලේදී ඔබ යෝසෙප් කල ක්‍රියාවම කල යුතුය. එනම්, ඔබ දෙවියන්වහන්සේගේ සැලැස්මට එකගවී උන්වහන්සේගේ සැලැස්මට සහයෝගය දිය යුතුය. යෝසෙප් ජීවිතයේ U ටර්න් එකක් හෙවත් සම්පූර්ණ හැරීමක් සිදුවිය. යෝසෙප්ගේ ජීවිතයේ මරියා ගැන තිබූ සැලැස්මට වඩා දෙවියන්වහන්සේ ඔහු ගැන තිබූ සැලැස්ම මහත්වූ එකකි. ඔබත් ඔබගේ ජීවිත තුළ දෙවියන්වහන්සේගේ සැලැස්මට සහයෝගය දෙමින් ක්‍රියා කරන්නේ නම්, එය පසු කාලයේදී ඔබගේ ජීවිතයට සාර්ථකත්වය ගෙනෙනවා ඇත.

ප්‍රිය මිත්‍රවරුනි, ඔබ ගැන දෙවියන්වහන්සේට විශාල සැලැස්මක් ඇත. දේව වචනයෙහි මෙසේ පවසයි. ***''මා විසින් නුඹලා ගැන කරන යෝජනා මම දනිමි, නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සාමාදානයේ යෝජනායයි ස්වාමීන්වහන්සේ කියන සේක.'' (යෙරමියා 29:11)***

මෙහිදී දෙවියන්වහන්සේ පවසන්නේ, 'මා කුමක් කරනවාද කියා මා දනිමි. එම සියලුම දේ මා සැලසුම්කර හමාරයි. ඔබව සලකන පිණිස මාගේ සැලැස්ම ඉතාම යහපත්. ඒවා නපුරු සැලැස්මක් නොවෙයි. ඔබ බලාපොරොත්තු වන්නාවූ දේ දෙන පිණිස මාගේ සැලැස්ම යහපත්ය. ඔබ දෙවියන්වහන්සේව විශ්වාස කරනවාද? එසේත් නොමැතිනම් ඔබ ඔබවම විශ්වාස කරනවාද? ඔබ විශ්වාස කරන්නේ ඔබගේ සැලැස්මද? ඒසේත් නොමැතිනම් දෙවියන්වහන්සේගේ සැලැස්මද? දෙවියන්වහන්සේගේ සැලැස්මට සහයෝගය දී ඔබ ඔබගේ ජීවිතය ජීවත්විය යුතුය. යෝසෙප් මෙන් දෙවියන්වහන්සේගේ සැලැස්මට එකඟවී සහයෝගය දී ජීවත් විය යුතුය.

## (2). එඬේරු සැමරුවේය.

***''දේව දූතයා ඔවුන්ට කථාකොට, භයනොවෙල්ලා, බලව, මුළු සෙනඟට මහත් ප්‍රීති උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි. මක්නිසාද ස්වාමීවූ ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් නුඹලාට දාවිත්ගේ නුවර අද උපන් සේක.'' (ලූක් 2:10-11)***

ඒ දින වලදී එඬේරුන් කියන කොට්ඨාශය සමාජයේ ඉතාම පහත් මට්ටමක සිටියාවූ අයයි. නව ගිවිසුමේ කාලයේදී රෝම අධිරාජ්‍ය එඬේරුන්ට සලකනු ලැබුයේ ඉතාම පහත් මට්ටමකින්ය. කිසිවකු තමා ළඟට ගැනීමට නොහැකි තරම් එඬේරුන් කණ්ඩායම ඉතාමත්ම අපිරිසිදුය. ඔවුන් සිටින්නේ නිතරම තෙත්වූ



ඇඳුම් ඇතිවය. කිසිවෙක් කැමති නොවන්නාවූ චරිතයක් ඔවුන්ට තිබුණි. මෙවැනි අයව කිසිදු උත්සවයකට ගෙන්වාගන්නේ නැත. නමුත් දෙවියන්වහන්සේ ඉහළ මට්ටමේ සිට මේ පහත්වූ මට්ටමේ ජීවත්වෙන්නාවූ අයටද යේසුස් වහන්සේගේ උපන්දින සාදයට ආරාධනා කලේය. සෑම දිනකම රාත්‍රියේදී ඔවුන් තම රැළ බලාගන්නා පිණිස පිට්ටනියෙහි තණකොළ මත නිදා ගත්තේය. මධ්‍යම රාත්‍රියේදී දේව දූතයෙක් ඔවුන්ට දර්ශනය වී මහත් වූ ආලෝකයකින් ''භිය නොවන්න, මෙන්න නුඹලාට ප්‍රීතිය උපදවන්නාවූ ශුභ ආරංචියක් දෙන පිණිස ආවේය'' කියා පැවසූ බව දේව වචනයෙහි සඳහන්ව ඇත. දේව දූතයින් දර්ශනය වන්නාවූ සෑම අවස්ථාවකදීම එම එඬේරුන් කණ්ඩායම අමතනු

6 වෙනි පිටුවට....

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**දෙසැ:19-** "කැඳවීමේ ප්‍රතිරාවය" පුවත්පත් මුද්‍රණාලයේ රාජකාරියේ යෙදෙන අයගේ කාර්යක්ෂමතාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ:20-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය සාතන්ගේ බලවේග වලින් ආරක්ෂා වීම ගැන ස්තුති කරන්න.

**දෙසැ:21-** "කැඳවීමේ ප්‍රතිරාවය" පුවත්පත් සේවයේ සියලුම සහකාර කතෘවරුන්ගේ පවුලේ අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ:22**- ශුභාරංචිය අසා නැති ජනතාව වෙසෙන ප්‍රදේශ වෙත ඇතුල්වීමට දෙවිඳුන්ගේ අනුග්‍රහය ලැබෙන බැවින් ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ:23**- ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහල, නෙහෙමියා බයිබල් විදුහල, දේවධර්මයේ ලිපි හුවමාරු පාඨමාලාව ගැන ස්තුති කරන්න.

**දෙසැ:24**- සම්බන්ධීකාරකරුවන් සහ ඔවුන්ගේ පවුල් අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ:25**- ලෝකයේ ගැලවුම්කරු යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සිහිකර ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ:26**- කොරෝනා වෛරස් ආසාදනය තුරන්ව යන පිණිස ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ:27**- දේව සේවක පවුල් මත ආශිර්වාද වර්ශා පතිතවීමට ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ:28**- දේව සේවකයන් වෙත බලවත් කැපවීම් ඇති වන පිණිස ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ:29**- මේ වසරේ සෑම කිතුණු නිකායක්ම හොඳින් ක්‍රියාත්මක වීම ගැන ස්තුති කරන්න.

**දෙසැ:30**- මේ වසරේ දෙවියන්වහන්සේගේ මෙහෙකරුවන්ට ලැබුන දිව්‍යමය ආරක්ෂාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ:31**- මේ වසරේ බලවත් හාස්කම් තුළින් දෙවියන්වහන්සේ අවශ්‍යතා සපයාදීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**2023 ජනවාරි මාසය**

**ජන:01-** "කැඳවීමේ ප්‍රතිරාවය" පුවත්පත් පාඨකයන් සාමය සපිරි 2023 වසරට ඇතුල්වීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:02-** ප්‍රධාන සභා සහ ශාඛා සභා වලට නවක ඇදහිලිවතුන් පැමිණීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**ජන:03-** සෑම කිතුණු සභාවල් සඳහා ආශිර්වාද පොරොන්දුවක් දෙවිඳුන්ගෙන් ලැබීම සඳහා ස්තුති ප්‍රශංසා කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජන:04-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් මාධ්‍ය අංශයට වීඩියෝ කැමරාවක් ලබා දීම ගැන යාච්ඤා කරන්න.

**ජන:05-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලේ, නෙහෙමියා බයිබල් විදුහලේ, දේවධර්මයේ ලිපි හුවමාරු පාඨමාලාවේ විදුහල්පතිවරුන් ගුරුවරුන් සිසු සිසුවියන් ගැන යාච්ඤා කරන්න.

**ජන:06-** ලෝකයේ සෑම කිතුණු අධ්‍යාපන ආයතනයක්ම හොඳ නමක් පවත්වාගැනීම පිණිස යාච්ඤා කරන්න.

**ජන:07-** සියලු කිතුණු පවුල්වල සාමය පැවතීම ගැන යාච්ඤා කරන්න.

**ජන:08-** ලෝකයේ සෑම පුරවැසියන්ම අලුත් රෝග වලින් ආරක්ෂා වී හොඳ කායික සුවයක් ලබන පිණිස යාච්ඤා කරන්න.

**ජන09-** සෑම පුරවැසියෙකුගේම ආදායම් මාර්ගය වැඩිදියුණු වන පිණිස යාච්ඤා කරන්න.

**ජන:10-** සෑම කිතුණු සභාවක්ම සාතන්ගේ බලවේගවලට විරුද්ධව සිටීමට දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජන:11-** ලෝකයේ දේශපාලන නායකයින්ට දිව්‍යමය ප්‍රඥාව තම රටවැසියන්ගේ සුභසිද්ධිය පිණිස ක්‍රියාකිරීමට බලය ඉල්ලා යාච්ඤා කරන්න.

**ජන:12-** සෑම කිතුණු නිකායක්ම රජයේ නීතිවලට අනුකූලව නීත්‍යානුකූල ලියාපදිංචිය ලබාගන්නා පිණිස යාච්ඤා කරන්න.

**ජන:13-** තරුණ ප්‍රජාව තුළින් හිංසනය හා මිනිමැරීමේ ආත්මය දුරුවී ඔවුන් ශුද්ධාත්මයෙන් පිරෙන පිණිස යාච්ඤා කරන්න.

**ජන:14-** දේශයන් අතර සාමය ඇතිවී ආර්ථිකය වර්ධනය වීම උදෙසා යාච්ඤා කරන්න.

**ජන:15-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධ සේවා අංශවල ආශිර්වාදය පිණිස යාච්ඤා කරන්න.

**ජන:16-** කිතුණුවන් දේව වචනය අනුගමනය කරමින් ක්‍රිස්තු ආකාර හැසිරීමක් පවත්වා ගන්නා පිණිස යාච්ඤා කරන්න.

**ජන:17-** දෙවියන්වහන්සේගේ බලවත් හස්ථය පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අයට ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජන:18-** යාච්ඤා මැදිහත්කරුවන්, මහා ආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු සෑම සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල අය ආශිර්වාද ලබාගන්නා පිණිස යාච්ඤා කරන්න.

*4 පිටුවෙන්....*

ලැබුයේ, 'බිය නොවන්න' කියාය. මන්ද දේව දූතයෙක් දුටුවහොත් 'මනුෂ්‍යයින් මැරෙනවාය' කියා මතයක් තිබුනි. මහත් ප්‍රීතිය උපදවන්නාවූ ශුභාරංචිය කිතුණුවන්ට පමණක් නොව ලෝකයෙහි වෙසෙන්නාවූ සෑම ජාතීන්ටම අයිතිය කියා මෙම පණිවිඩය දුන්නේය.

යේසුස් වහන්සේ මේ පොළොවට පැමිණියේ, සෑම මනුෂ්‍යයෙක්ම ගළවාගන්නා පිණිසයි. මෙම දූත පණිවිඩය සියලුම ජාතීන්ට හා සියලුම දෙනාටයි. දාවිත්ගේ නුවර ඔබ වෙනුවෙන් ගැලවුම්කාරයෙක් උපත ලැබුවේය කියා දූත් පණිවිඩය අසා එඬේරුන් බෙත්ලෙහෙමට දිව ගියේය. ***"මරියා යෝසෙප්ද ගවයන් කන ඔරුවේ බාවා උන් ළදරුවාද දුටුවෝය. ඔව්හු ඒ දැක, මේ ළදරුවා ගැන තමුන්ට කී දේ දැන්වූවෝය. ඒ ඇසූ සියල්ලෝ තමුන්ට එඬේරුන් විසින් කියන ලද දේවලට පුදුමවූවෝය." (ලූක් 2:16-18)***

එඬේරුන් ඉක්මනින්ම බෙත්ලෙහෙමට ගොස් මරියා සහ යෝසෙප්ද රෙදි වලින් තිබූ දරුවාද දැක නමස්කාරය කර දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් ඔවුන් සිටි ස්ථානවලට නැවත ගියෝය. දේව දූතයා පැවසූ ලෙස ඔවුන් සිදුවූ දේ දැක දෙවියන්වහන්සේට ගායනා හා ප්‍රශංසා කරමින් උන්වහන්සේගේ උපත සැමරුවේය. යෝසෙප් සහයෝගයෙන් වැඩ කලේය. එඬේරුන් දෙවියන්වහන්සේව සැමරුවේය. නත්තල යනු මලගෙයක් නොව එය සැමරුමකි.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත සෑම ජාතීන්ටම ප්‍රීතිය ගෙන දෙන්නේය. අප වෙනුවෙන් අද දවසේ දාවිත්ගේ නුවර ගැලවුම්කාරයා නැමති ක්‍රිස්තුස්වහන්සේ ඉපදුනේය. මෙයයි හොඳම පණිවිඩය. ඔබගේ පාපයට කමාව තිබේ. ඔබගේ ජීවිතයේ ජීවත් වීමට අරුතක් තිබේ. නත්තල කරණකොටගෙන ස්වර්ගයෙහි ඔබට ඉඩක් තිබේ. මෙය ඉතාම ප්‍රීතිමත් වූ අවස්ථාවකි. ඔබට ආශිර්වාදය අවශ්‍ය නම්, එඬේරුන් සැමරුවාක් මෙන් දෙවියන්වහන්සේ අප සමඟ සිටින බව අප සැමරිය යුතුය. අද සියලුදෙනා විවිධාකාරයෙන් නත්තල සැමරුව නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව කිසිවක් ප්‍රකාශ කරන්නේ නැත. මෙම සැමරීමේ ප්‍රධාන කාරණාව නම්, දෙවියන්වහන්සේ අප සමඟයි. උන්වහන්සේ මේ ලෝකයට පැමිණි නිසා අප මේ ලෝකයෙහි තනිවී නොමැත. අපගේ ජීවිතයට උන්වහන්සේගේ සැලැස්මක් තිබේ. උන්වහන්සේ අපට ප්‍රේම කරයි. උන්වහන්සේ අපගේ සෑම පාපයකටම කමාව දී අපගේ ජීවිතය තුළ යහපත් සැලැස්මක් ඉටු කරයි. මේ කාලයේදී අප සැමරිය යුත්තේ මෙයයි.

එඬේරු සැමරුවා පමණක් නොව ඔවුන් මෙම පණිවිඩය මෙම අන් අය සමඟ බෙදාගත්තේය. ඔවුන් දුටු මෙම සෑම ශුභාරංචියම බෙදා ගත්තේය. අන්තිමයටම ඔබ මෙම ශුභාරංචිය බෙදාගත්තේ කවදාද? ඔබ කවදා හෝ කාට හරි මෙම ශුභාරංචිය පවසා තිබේද? අප දිය යුතු ශුභාරංචිය නම්, යේසුස් වහන්සේ තුළ අපට පව්කමාව තිබේ. ජීවිතයට අරුතක් තිබේ. ස්වර්ග රාජ්‍යයෙහි ඉඩක් තිබේ. උන්වහන්සේව විශ්වාසකරමින් පිළිගන්නාවූ ඕනෑම කෙනෙක්ට මෙම ආශිර්වාදය ලැබෙනු ඇත. මිත්‍රය, ඔබ මෙම ශුභාරංචිය පවසනවාද? එඬේරුන් ඔවුන් හමුවූ සියලුදෙනා සමඟම මෙම පණිවිඩය බෙදාගත්තේය. ඔවුන් යේසුස් වහන්සේව සමරනු ලැබීය. යෝසෙප් සහයෝගයෙන් වැඩ කරනු ලැබීය. අපත් යේසුස් වහන්සේගේ උපත අන් අය හා සමඟ බෙදා ගනිමින් සමරමු.

## (3). මරියා මෙනෙහි කලාය.

***"ඔව්හු ඒ දැක, මේ ළදරුවා ගැන තමුන්ට කී දේ දැන්නුවෝය. ඒ ඇසූ සියල්ලෝ තමුන්ට එඬේරුන් විසින් කියනලද දේවලට පුදුම වූවෝය. නමුත් මරියා ඒ සියලු කීම් සිතේ තබාගෙන මෙනෙහිකලාය." (ලූක් 2:17-19)***

මරියා ඉතා ලාබාල තරුණියෙක්ව සිටියදී යෝසෙප්ට විවාහබස් දී සිටියදී ඇය ගර්භණියක් විය. ඇය යෝසෙප්ට විවාහකර දීමට නියමකර තිබුනා පමණි. මේ කාලය තුලදී ශද්ධාත්මයාණන් කරණකොට ගෙන ඇය දෙවියන්වහන්සේගේ පුත්‍රයාව කුසේ දරාගත්තේය. කිසිවෙක් එය විශ්වාස නොකරන බව ඇය දැන සිටි නමුත් මරියා මේ කිසි දෙයක් ගැන කලබල වූයේ නැත. මන්ද දෙවියන්වහන්සේ විසින් ඇයට පැවසූ දෙය හා උන්වහන්සේගේ පොරොන්දුව ඇය විශ්වාස කලේය. යෝසෙප් සහයෝගයෙන් වැඩ කලේය. එඬේරුන් සැමරුවේය. මරියා සෑම දේම සිතේ ධාරණය කරගත්තේය. ඇය දෙවියන්වහන්සේගේ වචනය මෙනෙහි කලාය. එඬේරුන් විසින් මෙම සුභ පණිවිඩය සියල්ලන්ටම ප්‍රකාශකල විට සියලු දෙනාම මවිත වූ නමුත් මරියා ඇය ඇසූ සෑම වචනයක්ම දෙවියන් වහන්සේගේ ක්‍රියාවක්ම ඇගේ හදවත තුල ධාරණය කරගත්තේය. දෙවියන්වහන්සේ විසින් එම කාලයෙහි සිටි සෑම කාන්තාවක් අතරින්ම ආශිර්වාද ලැබීමට මරියාව තෝරා ගත්තේය. ඇයව යේසුස් වහන්සේගේ මව වීමට තෝරා ගත්තේය.



දෙවියන්වහන්සේ ඇයට කථා කල විට ඇය එයට ඇහුම්කන් දෙමින් ඒවා නිතරම මතක් කරමින් සිතේ ධාරණය කර ඒ ගැන මෙනෙහි කලාය. මාගේ ප්‍රිය මිත්‍රය

ඔබ දෙවියන්වහන්සේගේ වචනය විශ්වාස කරන්නාවූ කෙනෙක් නම්, ඒවා නිතරම මෙනෙහි කරන්නාවූ කෙනෙක් නම්, දෙවියන්වහන්සේ සැබැවින්ම ඔබට ආශිර්වාද කරනු ඇත. නමුත් ඔබ ලෝකයේ දේ විශ්වාස කරමින් ලෝකයේ දේවලට ඇලුම්ව සිටීනම්, ඔබට මෙය අත්පත් කර ගැනීමට බැරිය.

ඔබ මරියා මෙන් ආශිර්වාදය ලැබීමට කැමති නම්, ඔබ දෙවියන්වහන්සේගේ වචනය නිතරම මෙනෙහි කරමින් එය සිතේ ධාරණය කරගත යුතුයි. මරියා මේ දේ කරනු ලැබිය. දෙවියන්වහන්සේ දුන් ආශිර්වාද ලත් පොරොන්දුව මරියාට පමණක් නොව දේව වචනයට ප්‍රේම කරමින් ඉගෙන ගන්නාවූ සෑම කෙනෙකුටම අයිතිය. ඔබ දේව වචනය අසන්නාවූ පුද්ගලයෙක් පමණක් නොව එය ක්‍රියාවට දමන්නාවූ පුද්ගලයෙක් වන්න. එවිට ඔබ ආශිර්වාදය ලබනු ඇත.

ඔබ දේව වචනය ඕනෑ කමින් කියවන්නාවූ හා මෙනෙහි කරන්නාවූ කෙනෙක් නම්, එය ඔබ ක්‍රියාවට දමනවා නම්, එම වචනය ඔබව නිදහස් කරනු ඇත. ඔබට ආශිර්වාදය ලැබෙනු ඇත. ඔබගේ නිවසෙහි බයිබලයක් තිබූ නමුත් ඔබට ආශිර්වාදය ලැබෙන්නේ නැත. නමුත් දේව වචනය කියවා ඉගෙන ගෙන එය මෙනෙහි කරමින් නිතරම ඒ ගැන ඔබ සිතනවා නම් එය හදවතෙහි ධාරණය කරගන්නවා නම් දේව වචනයෙහි පවසා ඇති දේ ඔබ කරනවා නම්, ඔබ ආශිර්වාද ලත් කෙනෙකු වන්නේය.

***"මේ ව්‍යවස්ථා පොත නුඹේ මුඛයෙන් පහනොවේවා, එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්න පිණිස රෑ දාවල් ඒ ගැන මෙනෙහි කරපන්න. එවිට නුඹේ මාර්ගය සඵලවී නුඹට ශුභ සිද්ධ වන්නේය. (යෝෂුවා 1:8)*** එනම්, මෙහි පවසනු ලබන්නේ, වචනය මතකයේ තබාගෙන එය ඉගෙනගෙන, භාවනා කරමින් කීකරුවෙන්න ය කියාය. එවිට ඔබට ශුභ සිද්ධ වන්නේය. මෙයයි දෙවියන්වහන්සේගේ පොරොන්දුව ඔබ දේව වචනය කොතරම් දුරට අනුගමනය කරනවාද එතරම් දුරට ඔබගේ ජීවිතය සාර්ථක වන්නේය. එම නිසා දුරට ඔබගේ ජීවිතය සාර්ථක වන්නේය. එම නිසා මරියා මෙන් දේව වචනය සිතෙහි ධාරණය කරගන්න.

## (4). දිවැසිවරු කැපවීමක් කලේය.

***"ඔව්හු ගෙට වැද ළදරුවා ස්වකීය මවුවූ මරියා සමඟ සිටිනවා දැක, බිම වැටී උන්වහන්සේට නමස්කාර කොට, තමුන්ගේ කරඬු හැර රන්ද කට්ටකුමංචල් ද සුවඳ ලාටුද යන පඬුරු උන්වහන්සේට පිදුවෝය."***

දිවැසිවරු යනු ඒ කාලයේදී රජවරුන්ට උපදෙස් දෙමින් කරුණු පැහැදිලි කලාවූ අයයි. මෙහි සඳහන්ව ඇති දිවැසිවරු බොහෝ දුරට ඉරාකයේ හෝ ඉරාන ප්‍රදේශ වල සිටි අය විය හැක. මන්ද එම කාල වකවානුවේදී බබිලෝනියේ අධිරාජ්‍ය වී තිබුනේ මේ පලාතයි. දානියෙල්ද මෙහිදී පුහුණුවක් ලැබූ කෙනෙකි. එම කාලයේ සිටි ඉතා ප්‍රඥාවන්ත හා නුවණැති අය වූයේ නැගෙනහිර ප්‍රදේශයේ සිට මෙම දිවැසිවරුන්ය. එම නැගෙනහිර පලාතේ සිටි බොහෝ අය විද්‍යාඥයින්, විද්‍යාවේ හා සාහිත්‍යයේ අති විශිෂ්ඨ වූ පුද්ගලයින්ය. මේ අය එඬේරුන්ට වඩා හාත්පසින්ම වෙනස්වූ පුද්ගලයින්ය. මෙම දිවැසිවරු නැගෙනහිර සිට බෙත්ලෙහෙමට ගමන් කලේය.

බබිලෝනිය, ඉරානය, ඉරාකය, පර්සියාව යන රටවලට හා බෙත්ලෙහෙමට ගමන් කිරීමට සිදුවුව හොත් ඒ සඳහා බොහෝ මුදලක් වැය කිරීමට අවශ්‍ය වනු ඇත. මේ දිවැසිවරු බොහෝ පොහොසත්ව සිටියේය. ඔවුන් අහසේ තාරකාවන් දැක ඔවුන්ගේ දැනීමේ හැටියට එය විමසා බලා බෙත්ලෙහෙමෙහි ගැලවුම්කරු ඉපදී සිටින බව දැනගත්තේය. එම නිසා ඔවුන් මහත් බලාපොරොත්තුවක් ඇතිව බෙත්ලෙහෙම බලා ගමන් ඇරඹුවේය. ඔවුන් සත්‍ය සොයමින්, දෙවියන්වහන්සේව සොයමින් ගමන්කරනු ලැබුවේය.
මිත්‍රය අද ඔබ සත්‍ය සොයනවාද? ඔබ යේසුස් වහන්සේට ඔබගේ ජීවිතයට පැමිණෙන ලෙසට ආරාධනා කරනවා නම් උන්වහන්සේ ඔබව පිළිගැනීමට කැමැත්තෙන් සිටී. ඔබ සිටින ආකාරයෙන්ම උන්වහන්සේ වෙතට එන්න. මෙම දිවැසිවරු යේසුස් වහන්සේව සොයමින් ආවේය. නුගත් මිනිසුන් පමණක් නොව ඉතා ප්‍රඥාවන්ත වූ අයත් යේසුස් වහන්සේව සොයයි.

මෙම දිවැසිවරු පැමිණ ළදරුවා හා මව වූ මරියාවත් දැක නමස්කාර කලේය. ***"ඔව්හු ගෙට වැද, ළදරුවා ස්වකීය මවු වූ මරියා සමඟ සිටිනවා දැක බිම වැටී උන්වහන්සේට නමස්කාර කොට තමුන්ගේ කරඬු හැර රන්ද කට්ටකුමංචල්ද සුවඳ ලාටුද යන පඬුරු උන්වහන්සේට පිදුවෝය." (මතෙව් 2:11)***

අපි මෙහිදී දකින්නාවූ කාරණය නම් ඔවුන් මරියාට නමස්කාර නොකල අතර ඇය මෙම ස්ථානයේ සිටියත් ඔවුන් නමස්කාර කරනු ලැබුයේ යේසුස් වහන්සේට පමණයි. ඉන්පසු ඔවුන් රන්ද කට්ටකුමංචල්ද සුවඳ ලාටුද යන පඬුරු උන්වහන්සේට පුද කලේය. යේසුස් වහන්සේ අපගේ ජීවිතය තුළ කුමක් කරනවාද යන කාරණයට අඩයාලාමක් ලෙස ඔවුන් මෙම ත්‍යාග පුද කලේය. දේව දූතයින් විසින් ඔවුන්ට සිහිනයකින් කථාකොට පැමිණි මාර්ගයෙන් නොව වෙනත් මාර්ගයකින්

*9 වෙනි පිටුවට ...*



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

### ''...කියවන්නා තේරුම් ගනීවා....'' (මතෙව් 24:15)

## GOD ANSWERS THE PRAYER OF THE WEAK!

දුර්වලයාගේ යාච්ඤාවට දෙවියන්වහන්සේ පිළිතුරු දෙන සේක, දෙවියන්වහන්සේගේ කරුණාව කරණකොටගෙන 1969 ඔක්තෝම්බර් මස 08 වන දින සිට ශුභාරංචි සේවය සඳහා පත්‍රිකා බෙදා දීම, යාච්ඤා රැස්වීම් පැවැත්වීම හා දේව වචනය දේශනා කිරීම ආරම්භ කලෙමි.

මා දෙවියන්වහන්සේගේ සේවය කරන්නෙක්ය කියා කිසිවක් පිළිගත්තේ නැත. මා සේවයට අලුත් නිසාත් තරුණයෙක්ව සිටි නිසාත් කිසිවෙක් මාව පිළිගත්තේ නැත. නමුත් මා මෙම සේවාවන් ඉදිරියට කරගෙන යාමට විශාල ආර්ථික අර්බුද වලට මුහුණු දීමට සිදුවිය.



මගේ සේවය කරන පිණිස දිනපතා විශාල දුරක් ගමන්කලෙමි. සේවය කිරීමට මුදල් සහ සේවය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා මා හට මුදල් අවශ්‍ය තිබුණි. මගේ සේවය ආරම්භ කල දින සිට මගේ තීරණය වූයේ මාගේ මිත්‍රයින්ගෙන් හෝ ඥාතීන්ගෙන් කිසිදු උපකාරයක් ලබාගන්නේ නැත කියා, මන්ද මා කැඳවූ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සේවය කිරීමට මට අවශ්‍ය සියලු උපකාරයන් දෙන්න ඕනි කියන විශ්වාසය මා තුළ තදින්ම වැදී තිබුණි. මෙම ප්‍රතිපත්තිය අනුව ජීවත්වීමේදී මට බොහෝ අමාරුකම් වලට මුහුණදීමට සිදු විය. මා ශාරීරිකවත් මානසිකවත් බොහෝ අසීරුතාවයන් වලටද පත්විය. ඉන්දියාවේ ගමනාගමන මණ්ඩලයෙහි මාගේ ඥාතියෙක් වන ස්වර්ණ රාජ් මට රජයේ රැකියාවක් ලබා දීමටත් තවත් දේව දාසයෙක් වූ කාලෙබ් මා හට රැකියාවක් සොයා දීමටත් බොහෝ උත්සාහ දැරුවුත් ඒ සියල්ල නිශ්ඵල විය. 1971.05.17 වන දින මා නිරාහාරව යාච්ඤා කරන විටදී ආත්මයාණන්වහන්සේගේ මඟ පෙන්වීම ඇතිව මා හට ස්ථිර රැකියාවක් ලබා දෙන්නය කියා යාච්ඤා කලෙමි. මාසයක් ඇතුලත මා හට ස්ථිර රැකියාවක් ස්වාමීන් වහන්සේ ලබා දෙන බවට මෙම යාච්ඤාවේදී මා හට ස්ථිරත්වයක් ලැබුණි. දේව වචනයෙහි පවසා ඇති පරිදි, *''උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැකකම නම්, අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවෙත් උන්වහන්සේ අපගේ ඉල්ලීම අසන බවය. අප යම් දෙයක් ඉල්ලන කල උන්වහන්සේ අසන බව අපි දනිමු නම්, අප උන්වහන්සේගෙන් ඉල්ලූ දේ අපට ලැබෙන බව දනිමුව.'' (1 යොහාන් 5:14-15)*



මා හට නව රැකියාවක් ලැබී තිබෙනවාය කියා විශ්වාස කරමින් එය සියලුදෙනාටම ප්‍රකාශ කලෙමි. මෙය දුටු බොහෝ අය මානසික රෝගියෙක්ය කියා සිතුවේය. මා හැම දිනකදීම තැපැල්කරු පැමිණෙනතෙක් මගබලාගෙන සිටියෙමි. ඊට මාසයකට පසු එනම් 1971.06.18 දින මා ඇදහිල්ලෙන් තැපැල් කන්තෝරුව





වෙත ගියෙමි. එහ සිටි නෙල්ලි අප්පන් නැමති තැපැල්කරු මගේ නමට කිසිදු ලිපියක් නැතැයි කියා පැවසුවේය. නමුත් දෙවියන්වහන්සේගේ පොරොන්දුව මා තදින්ම අල්ලාගෙන එහි පුටුවක් මත වාඩිවී යාච්ඤා කලෙමි. ඊට විනාඩි කීපයක් තුල එහි සිටි තැපැල්කරුම මා ළඟට පැමිණ ඔබගේ නමට ලිපියක් ලැබී තිබෙනවා එය අත්සන් කර භාරගන්නය කියා පැවසීය.



My co-workers when I left my Government job - 1994

මා එම ලිපිය විවෘත කර බැලූ විට රජයේ කම්කරු දෙපාර්තමේන්තුවේ චෙන්නෙයි කාර්යාලයේ TNPSC පත්වීමේ ලිපිය වසර ගණනාවකට පෙර මා ලියූ විභාගයේ ප්‍රතිඵලයක් ලෙස මට ලැබුණි. මගේ යාච්ඤාව කරණකොටගෙන හාස්කමක් තුලින් ස්ථිර රැකියාවක් මා හට ලැබුණි.

මා චෙන්නෙයි වලට පැමිණ ප්‍රීතියෙන් යුතුව රැකියාව භාරගත්තෙමි. එම රැකියාවෙන් මා හට ලැබුණ වැටුපෙන් වැඩිම කොටසක් මා මගේ සේවය සඳහා යෙදෙව්වෙමි. 1994 වන වර්ෂයේදී දෙවියන්වහන්සේ මට කථාකරමින් මගේ රැකියාව අත්හැර පූර්ණකාලීන සේවයට එන පිණිස මඟපෙන්විය. මා ස්වාමීන්වහන්සේගේ හඬට කීකරු වී පූර්ණ කාලීන සේවය ආවෙමි. අපගේ දෙවියන්වහන්සේ යහපත්ය. උන්වහන්සේගේ අත තදින් අල්ලාගත හොත් ඔබට සාර්ථකත්වය ලැබෙනු ඇත. අද දවසේදී උන්වහන්සේ ඔබගැන ඉතා ඕනෑකමින් යුතුව බලා සිටී.

***''ඔබ කෙරෙහි සිත තබා සිටින තැනැත්තා, ඔබ කෙරෙහි විශ්වාසකරන බැවින් ඔබ ඔහු ශාන්ත සමාදානයෙන් ආරක්ෂා කරනසේක.'' (යෙසායා 26:3)***

■ ■ ■

***7 පිටුවෙන්....***

නැවත යන ලෙස පැවසූ බැවින් ඔවුන් වෙනත් මාර්ගයකින් ගමන් කලේය. ඔබ යේසුස් වහන්සේ සමඟ ගමන්කරන විටදී උන්වහන්සේ ඔබගේ මාර්ගය වෙනස්කර අලුත් මාවතක් ඔබට රැගෙන යනු ඇත. ඔබගේ ජීවිතයෙහි ස්වාමීන්වහන්සේ සිටිනවා නම් ඔබගේ ජීවිතය තුළ වෙනසක් සිදුවිය යුතුයි. ඔබ උන්වහන්සේ වෙතට පැමිණෙන විටදී ආ මාර්ගයෙහි නොව නැවත වෙනත් මාර්ගයක ගමන්කල යුතුයි.

යේසුස් වහන්සේ වෙතට පැමිණීමට දිවැසිවරුන්ට විශාල මිලයක් ගෙවීමට සිදුවිය. නමුත් ඔවුන් යේසුස් වහන්සේව දුටු විට උන්වහන්සේට නමස්කාර කලේය. එනම් ඔබගේ ජීවිතයටද ආශිර්වාදය ලබා ගැනීමට අවශ්‍ය නම්, ඔබගේ ජීවිතය ස්වාමීන්වහන්සේට කැප කරන්න. යේසුස් වහන්සේට ඔබගේ ජීවිතයෙන් දිය හැකි විශාලම දීමනාව මෙයයි. ඔබගේ ජීවිතය ඔබට දෙනු ලැබූයේ ස්වාමීන්වහන්සේයි. එනම් මේ ජීවිතයෙහි කිසිවක් ස්වාමීන්වහන්සේ නොමැතිව කල නොහැකි වෙයි.

ඔබගේ ජීවිතය උන්වහන්සේට කැප කරමින් යාගයක් ලෙස භාරවෙන්න. ***''එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමාන වූ ශුද්ධ වූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකි වූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලම. එය නුඹලාගේ ආත්මික සේවය වේ.'' (රෝම 12:1)*** එබැවින් අපගේ ජීවිතය අපගේ වේලාව ත්‍යාගයක් ලෙස යේසුස් වහන්සේට පුද කරමු. ***''නුඹලා අවයවයන් අධර්මිෂ්ඨකමේ ආයුධ කොට පාපයට භාර නොදී නුඹලාම මළවුන්ගෙන් ජීවත්ව සිටින්නන් මෙන් දෙවියන්වහන්සේට භාර වී, නුඹලාගේ අවයවයන් ධර්මිෂ්ඨකමේ ආයුධ කොට උන්වහන්සේට භාරදීපල්ලා.'' (රෝම 6:13)*** ඔබගේ ජීවිතය දෙවියන්වහන්සේට කැප කිරීමට වඩා ප්‍රඥාවන්ත වූ කිසි දෙයක් නැත. ඔබගේ ජීවිතයේ සියලුම දේ දෙවියන්වහන්සේවයි. උන්වහන්සේට ඔබගේ ජීවිතය කැප කරන්න.

## ඔබ යේසුස්වහන්සේට දෙන්නේ කුමක්ද?

මේ නත්තලේ සමයේදී තෑගි බෝග ගැනීමට හා තවත් අවශ්‍යතා උදෙසා ඔබ බොහෝ මුදල් වැය කිරීමට සිදුවෙයි. ඔබ මේ නත්තලේදී අපගේ ස්වාමීන්වහන්සේට කුමක් දෙන්නට යනවාද? උපන්දින සාදයකදී අප එකිනෙකාට තෑගි බෝග ලබා දෙයි. එනම් මේ වසරේදී මේ නත්තලේදී ඔබ උන්වහන්සේ දීමට යන්නාවූ තෑග්ග කුමක්ද? ඔබ සන්තක සියල්ලම ඔබගේ ජීවිතයම මුළුමනින්ම යේසුස් වහන්සේට දෙනවාද? ඔබගේ මුළු ප්‍රේමයම යේසුස් වහන්සේට තෑග්ගක් ලෙස පුද කරන්න. උන්වහන්සේව සතුටින් භාරගන්න.

දිවැසිවරු ඔවුන්ගේ චාරිත්‍ර අනුව යේසුස් වහන්සේට තෑගි ගෙන ආවේය. නමුත් ඉතා උතුම්ම තෑග්ග නම්, දෙවියන්වහන්සේ තම ඒකජාතක පුත්‍රයා දෙන තරම් ලෝකයට ප්‍රේමකලේය. එසේ කරනු ලැබූයේ උන්වහන්සේව කෙරෙහි අදහාගන්නාවූ සැමදෙනාම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. එනම්, දෙවියන්වහන්සේ අපට දුන්නාවූ නත්තල් තෑග්ග නම් මෙයයි.

ඔබත් සමඟ මා බෙදා ගන්නාවූ කාරණා 4 එනම්, යෝසෙප් සහයෝගය දුන්නා, එඬේරු සැමරුවා, මරියා මෙනෙහි කරනු ලැබුවා, දිවැසිවරු කැපවීමක් කලේය, මිත්‍රවරුනි ඔබත් කුමක් කල යුතුද කියා තීරණය කරන්න. දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

************

RNI NO. TN/SIH/2006/17846

## Echo of His Call Postal Courses for candidates in India only

**Pray for** BIBLECOR



We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate.**

**There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, Post Box 2957, Chepauk, Chennai - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858, E.mail : biblecor@yahoo.co.in

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 2nd DECEMBER 2022.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**